PEOPLE'S BANK
The Bank of the People

# ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත

## (රාජ්‍ය /සංස්ථා / වෙනත් රාජ්‍ය ආයතන)

දිනය

කළමනාකරු, මහජන බැංකුව

……………………………………………………. ශාඛාව

කරුණාකර පහතින් ලබා දී ඇති තොරතුරුවලට අනුව සහ බැංකුවේ නීති රීති හා රෙගුලාසිවලට යටත්ව ජංගම/ඉතුරුම්/ස්ථිර තැන්පතු ගිණුමක් විවෘත කරන්න.

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි | | |
|---|---|---|
| ගිණුම් අංකය | | |
| CIF අංකය | | |
| තොරතුරු ඇතුළත් කරන ලද්දේ නම හා සේවා අංකය | නිලධාරී අත්සන සහ සේවා අංකය | කළමනාකාර අත්සන සහ සේවා අංකය |
| | | |
| ස්ථිර තැන්පතු කුවිතාන්සි අංකය | | |

☐ ජංගම ගිණුම් ☐ ඉතුරුම් ගිණුම් ☐ ස්ථිර තැන්පතු ගිණුම

මුදල් වර්ගය ☐ ශ්‍රී ලංකා රුපියල් ☐ විදේශීය මුදල් ……………… (කරුණාකර මුදල් වර්ගය සඳහන් කරන්න)

නිමැවුම් නාමය ……………… (ඇත්නම්)

| | |
|---|---|
| ගිණුමේ නම ……………………………… | තැපැල් ලිපිනය ……………………………… |
| ලියාපදිංචි කරන ලද ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ……………………………… | සංස්ථාපනය කළ/ලියාපදිංචි කළ දිනය ……………… <br> ලියාපදිංචි අංකය ……………… |
| | දුරකථන අංක ……………… <br> ෆැක්ස් අංකය ……………… <br> විද්‍යුත් තැපැල් ලිපිනය ……………… |

| ගිණුම් ප්‍රකාශන ලැබිය යුතු ආකාරය | | | |
|---|---|---|---|
| | ජංගම ගිණුම් | ☐ තැපැල් මගින් | ☐ විද්‍යුත් තැපැල් මගින් |
| | ඉතිරි කිරීමේ ගිණුම් | ☐ පාස් පොත | ☐ විද්‍යුත් ප්‍රකාශන |
| | ස්ථිර තැන්පත් අලුත් කිරීමේ නිවේදන | ☐ දෘඩ පිටපත | ☐ විද්‍යුත් නිවේදන පමණි |

අවශ්‍ය වනුයේ ☐ දෛනිකව ☐ සතිපතා ☐ මාසිකව

විද්‍යුත් තැපැල් ලිපිනය (ඉහත වෙනස් වේ නම්) ………………………………

## ස්ථිර තැන්පත් ගිණුම් සඳහා පමණි

තැන්පතු මුදල ☐☐☐☐☐☐☐☐☐☐ (ඉලක්කමෙන්) ……………………………… (අකුරෙන්)

කාලය (මාස) ☐☐ කරුණාකර පොලිය ගෙවන්න ☐ මාසිකව ☐ වාර්ෂිකව ☐ කල් පිරීමේදී

ස්වයංක්‍රීය අළුත් කිරීම ☐ ඔව් ☐ නැත

"ඔව්" නම්, ☐ පොලිය සහිතව අලුත් කිරීම ☐ පොලී රහිතව අලුත් කිරීම

පොලී රහිතව අළුත් කරන්නේ නම්, උපචිත පොලිය බැර කළයුතු ගිණුම් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

බැංකුව ……………………………… ශාඛාව………………………………

"නැත" නම්,

කරුණාකර කල් පිරෙන දිනයේ දී ගිණුම ක්‍රියාත්මක කිරීමේ/ගිණුම වැසීමේ උපදෙස් සමඟ ස්ථිර තැන්පත් කුවිතාන්සිය ඉදිරිපත් කරන්න. එසේ නොවුවහොත් කල්පිරීමේ දිනට පසු පොලී ගණනය කරනු ලබන්නේ බැංකුවේ අභිමතය අනුවය.

## ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) - (අදාළ පරිදි "✔" ලකුණ යොදන්න. )

1. ව්‍යාපාරයේ ස්වභාවය සහ අරමුණ

☐ සමාජ සේවා හා සුබසාධන ☐ නිෂ්පාදන ☐ තොග වෙළඳාම ☐ සිල්ලර වෙළඳාම ☐ ආනයන/අපනයන ☐ වෘත්තීය

☐ පෞද්ගලික සේවා ☐ ආහාර සැපයුම් / ආපන ශාලා ☐ සේවා කර්මාන්ත ……………… (කරුණාකර සඳහන් කරන්න) ☐ වෙනත් ……………… (කරුණාකර සඳහන් කරන්න)

2. අපේක්ෂිත ප්‍රමාණයන් : මසකට ගිණුමට රුපියල් වලින් ලැබෙන අපේක්ෂිත/සාමාන්‍ය තැන්පතු ප්‍රමාණයන්

☐ 500,000 හෝ ඊට වඩා අඩු ☐ 500,001 සිට 1,000,000 දක්වා ☐ 1,000,001 සිට 2,000,000 දක්වා ☐ 2,000,001 සහ ඊට වැඩි

3. වත්කම් ලැබෙන මූලාශ්‍ර

☐ රාජ්‍ය අරමුදල් ☐ බදු ආදායම් ☐ ආධාර ☐ ආයෝජන ☐ බැංකු පහසුකම් ☐ වෙනත් ……………… (කරුණාකර සඳහන් කරන්න)

## මෙහෙයුම් උපදෙස්

| සම්පූර්ණ නම | තනතුර | ජා.හැ.අංකය | අත්සන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

……………………………………………………………… විසින් මෙම ගිණුම මෙහෙයවීමට අදාළව ලබා දෙන උපදෙස් අනුව ක්‍රියා කිරීමට මින් බලය
(කරුණාකර තනතුරු මගින් මෙහෙයුම් උපදෙස් දක්වන්න)
පවරනු ලබන අතර, ගිණුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කලින් කලට සිදුවන සියලුම වෙනස්කම් ලිඛිතව බැංකුව වෙත දැනුම් දීමටද භාර ගනිමි./ගනිමු.

මෙම ගිණුම පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ඉහත ලබා දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම/අපි සහතික කරන අතර මෙම අයදුම්පතෙහි පසුපිටෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි මෙන්ම මෙම ගිණුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කලින් කලට පනවනු ලබන නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් ඒවායින් බැඳී සිටීමටත් මම / අපි එකඟ වෙමි/වෙමු.

………………………………………………
බලයලත් අත්සන්කරුවන්ගේ/ආයතන ප්‍රධානියාගේ/රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ අත්සන/අත්සන්/ (මුද්‍රාව තබන්න)

*සටහන : මෙම අයදුම්පත සමඟ ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ ආකෘති පත්‍ර ( PF 0300A සහ PF 0300B ) ලබා ගැනීම අවශ්‍ය නොවේ.*

## ඉතුරුම් ගිණුම් - කොන්දේසි හා නියමයන්

1. ගිණුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලබාදී ඇති උපදෙස් වෙනස්වන බවට දැන්වීමක් ලැබෙන තුරු ඉහත ලබාදී ඇති උපදෙස් වලංගු උපදෙස් සේ සලකනු ලැබේ.
2. ලිපිනය වෙනස් වූ අවස්ථාවක ඒ බව නොපමාව අදාළ ශාඛාව වෙත දැනුම් දිය යුතුය.
3. මුදල් හැරෙන්නට වෙනත් දෑ ඉතිරි කිරීමේ ගිණුමට සාමාන්‍යයෙන් රැස් කරනු නොලැබේ.
4. ඉතුරුම් ගිණුම් පාස්පොත අස්ථානගත වුවහොත් ඒ බව අප්‍රමාදව බැංකුවට ලිඛිතව දැනුම් දිය යුතුය. පාස් පොතක් නැතිවූ විට හෝ විකල වූ විට ඊට හේතු වශයෙන් සෑහීමකට පත්විය හැකි කරුණු ඉදිරිපත් කළවිට, බැංකුව විසින් ගිණුම් හිමිකරු වෙත නව පාස්පොතක් නිකුත් කරනු ඇත. එසේ නිකුත් කර නව පාස්පොත සඳහා කාලීනව බැංකුව විසින් තීරණය කරනු ලබන ගාස්තුව ගෙවීමට එකඟ විය යුතුය.
5. ගිණුමේ පැවතිය යුතු අවම ශේෂය හෝ "අවම ශේෂය" වශයෙන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන ශේෂය ගිණුමේ නොමැති විටදී මාසයක් සඳහා රුපියල් 25/- ක කොමිස් මුදලක් හෝ බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන කොමිස් ගිණුමෙන් අය කරනු ලබන අතර, එසේ ගිණුමෙන් කොමිස් මුදල් අයවීමෙන් ගිණුමේ මුදල් අවසන් වුවහොත් ගනුදෙනුකරු වෙත දන්වා යැවීමෙන් පසුව ගිණුම වැසීමේ අයිතිය බැංකුව සතු වේ. මේ සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ලබාදී ඇති අවසාන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යැවීම "ප්‍රමාණවත් දැන්වීමක්" සේ සැලකේ.
6. අවශ්‍ය අවස්ථාවලදී බැංකුව විසින් අයකරනු ලබන ගාස්තු සහ අයකිරීම් සඳහා ගෙවීම් කිරීමට එකඟ විය යුතුය.
7. ගිණුම් හිමිකරු විසින් විවෘත කරන ලද ගිණුමට බැංකුව විසින් ඉතිරි කිරීමේ පාස්පෙතක් නිකුත් කරනු ඇත. ගිණුම් හිමියා බැංකුවෙන් පිටව යාමට පෙර පාස් පොතෙහි සඳහන් පරිගණක සටහන් පරීක්ෂා කර බලා නිවැරදි බවට සෑහීමට පත්විය යුතුය.
   එසේ වුවද, ගනුදෙනුකරු විසින් විද්‍යුත් ගිණුම් ප්‍රකාශයක් ඉල්ලා සිටින අවස්ථාවක පාස්පොතක් නිකුත් නොකරනු ඇත.
8. පාස්පොත ඉදිරිපත් කිරීමෙන් ගිණුම් හිමියා ලෙස ඔහුගේ අත්සන සහ අනන්‍යතාවය තහවුරු කරන පුද්ගලයා පිළිගනිමින් බැංකුව විසින් ඔහුට/ඇයට මුදල් ගෙවීම් කරනු ලැබේ.
9. ඉතිරි කිරීමේ ගිණුමක් වසර 2 ක් ක්‍රියාකාරිත්වයේ නොපැවතියේ නම් වසර දෙක අවසානයේ අක්‍රීය ගිණුම් ගණයට මාරු වේ. එවැනි ගිණුම් අක්‍රීය ගණයට මාරු වී වසර 10 ක කාලයක් තුළ සක්‍රීයව පැවති බවට සාධක නොමැති නම් එම ගිණුම අත්හැර දැමූ දේපල ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ඇත.
10. **මෙම ගිණුම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කොන්දේසි හා නියමයන් වෙනස් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ එකතු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී. එසේ වෙනස් කළ, සංශෝධනය කළ හෝ එකතු කළ කොන්දේසි හා නියමයන් ක්‍රියාත්මක වූ විගස, ඒ බව ගනුදෙනුකරුවන් වෙත දන්වනු ලැබුවත් නැතත් ගනුදෙනුකරුවන් ඒවායින් බැඳී සිටිනු ඇත.**
11. **විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මෙහෙයවීම, පාලනය කිරීමේ විනිමය පාලන රෙගුලාසි සහ නියමයන් කෙරෙහි අනුකූලතාවයකින් යුතුව කටයුතු කිරීමට හා ඒවායින් බැඳී සිටීමට ගනුදෙනුකරු එකඟ විය යුතුය.**

## ජංගම ගිණුම් - කොන්දේසි හා නියමයන්

1. ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා නියමිත මූලික තැන්පත් මුදල එක් එක් ශාඛාව අනුව වෙනස් වේ. කරුණාකර ගිණුම විවෘත කිරීමට බලාපොරොත්තු වන මූලික තැන්පත් මුදල සඳහා නියමිත ප්‍රමාණය ගිණුම් විවෘත කිරීමට බලාපොරොත්තු වන ශාඛාවෙන් විමසන්න.
2. (අ) ගනුදෙනු කරන වේලාවන් ඒ ඒ ශාඛාවන් විසින් ප්‍රකාශිත ගනුදෙනු කරන වේලාවන්ය.
   (ආ) ජංගම ගිණුම් ශේෂවලට පොලී ගෙවනු නොලැබේ.
3. චෙක්පොත් සඳහා වන ගාස්තු ජංගම ගිණුමට හර කෙරේ. තවද, චෙක්පතකින් හැර අනෙකුත් ක්‍රමයකින් මුදල් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී. චෙක්පත් පරිහරණය කිරීමේදී පහත දැක්වෙන කරුණුවලට සුපරීක්ෂාකාරී ලෙස අවධානය යොමු කරන ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ඉල්ලුම් කරනු ලැබේ.
   (අ) චෙක්පොත්, බලය පවරනු නොලැබූ කිසියම් තැනැත්තෙකු අතට පත්වීමට ඉඩ නොතැබිය යුතුය.ගනුදෙනුකාර මහත්ම/මහත්මීන් වෙත නිකුත් කරනු ලැබූ චෙක්පොත/පොත් පරිහරණය කිරීමෙහිලා හෝ අන් ලෙසකින් හෝ සිදුවූ නොසැලකිලිමත්කමක් හේතුකොට ගෙන හොර අත්සන/අත්සන් යෙදූ චෙක්පතකට මුදල් ගෙවනු ලැබූ විට එහි වගකීම බැංකුව විසින් භාරගනු නොලැබේ.
   (ආ) චෙක්පත් අත්සන් කිරීමේදී බැංකුවේ තබා ඇති ආදර්ශ අත්සන් පතේ ආදර්ශ අත්සනට සමාන වූ අත්සන් තැබිය යුතුය.
   (ඇ) චෙක්පත් ලිවීමේදී මුදල් ගණන අකුරෙන් මෙන්ම ඉලක්කමෙන් ද පැහැදිලිව එකම භාෂාවකින් ලිවිය යුතු අතර, ලිවීමෙන් පසු අකුරු හෝ ඉලක්කම් අතරින් නැවත ලිවීමට ඉඩ නොතැබිය යුතුය.
   (ඈ) චෙක්පතක යම් වෙනසක් කිරීමට අවශ්‍ය වුවහොත් ඒ වෙනස් කිරීම අණකරුගේ සම්පූර්ණ අත්සනින් තහවුරු කළ යුතුය.
   (ඉ) ගෙවීම් සඳහා ඉදිරිපත් කරන දින සිට හය මාසයකට හෝ ඊට වැඩි කාලයකට පෙර දිනයක් දරන චෙක්පත්වලට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.
   (ඊ) තමා සතු චෙක්පොත හෝ එයින් කොලයක් හෝ අස්ථානගත වුවහොත් ඒ බව වහාම බැංකුවට දැන්විය යුතුය.
4. පහත දැක්වෙන කරුණුවලට ද හොඳින් අවධානය යොමු කරන ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
   (අ) ස්වකීය ගිණුමට කරනු ලබන එක් එක් ගෙවීම් සඳහා ඒ සම්බන්ධයෙන් වූ පිළිපතෙහි හෝ කුවිතාන්සියෙහි බැංකුවේ බලයලත් නියෝජිතයෙකුගේ සම්පූර්ණ අත්සන යොදා ඇති බව තහවුරු කරගත යුතුය. පරිගණක ගත ලදුපතක් නම් එවැනි අත්සනක් අවශ්‍ය නොවේ.
   (ආ) උපලබ්ධි නොවූ අයපත් මත නිකුත් කරන චෙක්පත් ගෙවීමට බැංකුව බැඳී නැත.
5. ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ගිණුම්වලින් මුදල් ආපසු ගැනීමේදී පහත කරුණුවලට සුපරීක්ෂාකාරී ලෙස අවධානය යොමු කළ යුතුය.
   (අ) ගනුදෙනුකරුවන් විසින් මුදල් ආපසු ගැනීමේදී පූර්ව විධිවිධාන සලසා ගැනීමකින් තොරව, ගිණුමේ ඇති මුදල් ශේෂය නොඉක්මවිය යුතුය.
   (ආ) ගිණුමේ ශේෂය සැලකිල්ලට ගෙන චෙක්පත් ලිවීමේදී ගනුදෙනුකරු විසින් බැංකුව නිකුත් කරනු ලැබූ නමුත් මෙතෙක් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකෙරුණු චෙක්පත් සියල්ලෙහි වටිනාකම අඩු කිරීමෙන් පසු ඉතිරිවන ශේෂයට පමණක් චෙක්පත් ලිවිය යුතුය.
   (ඇ) මෙම කොන්දේසි හා නියමයන්ට සහ බැංකුව විසින් විටින් විට පනවනු ලබන වෙනත් කොන්දේසි හා නියමයන්ට පටහැනිව නිකුත් කරනු ලබන චෙක්පත්වලට මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.
6. තැන්පත් කරන ලද චෙක්පත් උපලබ්ධි වී නොමැති බව හෝ වැරදීමකින් බැර වී ඇති ප්‍රවේශන පිළිබඳව ප්‍රමාදවී දැනගත්විටක එම උපලබ්ධි නොවූ චෙක්පත්වලට අදාළ බැර පිවිසුම්/වැරදීමකින් බැර වූ ප්‍රවේශන ප්‍රතිසාධනය කිරීමට බැංකුවට හිමිකම් ඇත.
7. බැංකුව විසින් එක් එක් ජංගම ගිණුම් හිමිකරු වෙත මාසික ගිණුම් ප්‍රකාශයක් සපයනු ලැබේ. ප්‍රකාශනය ලැබුණු කල්හි එය පරීක්ෂාකාරීව බලා යම් වරදක් හෝ වෙනසක් වේ නම් ඒ බව එම ප්‍රකාශනය ලැබී දින 14 ක් ඇතුලත බැංකුව වෙත දැන්විය යුතුය.
8. අවශ්‍ය අවස්ථාවලදී බැංකුව විසින් කොමිස් හා ගාස්තු අයකරනු ලබයි. ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොමැතිකමින් අගරු කරන ඒ ඒ චෙක්පත් සඳහා මෙන්ම ගෙවීම් නවත්වන චෙක්පත් සඳහාද බැංකුව කොමිස් මුදලක් අයකරනු ලබයි. චෙක්පතක මුදල් ගෙවීම නවත්වන ලෙස අණකරුවකුගෙන් ලැබෙන ලිඛිත උපදෙස් බැංකුව විසින් සටහන් කෙරෙනු ඇත. එහෙත් එසේ නොවන අවස්ථාවකදී, එවැනි උපදෙස් අනුව කටයුතු කරනු නොලැබූ විට බැංකුව වගකීමට පත් නොවේ.
9. මෙම කොන්දේසි හා නියමයන් වෙනස් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ එකතු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී. එසේ වෙනස් කළ, සංශෝධනය කළ හෝ එකතු කළ කොන්දේසි හා නියමයන් ක්‍රියාත්මක වූ විගස, ඒ බව ගනුදෙනුකරුවන් වෙත දන්වනු ලැබූවත් නැතත්, ඔවුන් හැමදෙනාම ඒවායින් බැඳී සිටිනු ඇත.
10. ඔබගේ ලිපිනයෙහි/විද්‍යුත් තැපැල් ලිපිනයෙහි ;සහ දුරකථන අංකයෙහි කිසියම් වෙනසක් සිදු වුවහොත් අදාළ ශාඛාව වෙත වහාම දැනුම් දිය යුතුය.
11. **විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මෙහෙයවීම, පාලනය කිරීමේ විනිමය පාලන රෙගුලාසි සහ නියමයන් කෙරෙහි අනුකූලතාවයකින් යුතුව කටයුතු කිරීමට හා ඒවායින් බැඳී සිටීමට ගනුදෙනුකරු එකඟ විය යුතුය.**
12. ජංගම ගිණුමක් වසරක කාලයක් ක්‍රියාකාරිත්වයේ නොපැවතියේ නම් වසර අවසානයේ අක්‍රීය ගිණුම් ගණයට මාරු වේ. එවැනි ගිණුම් අක්‍රීය ගණයට මාරු වී වසර 10 ක කාලයක් තුළ සක්‍රීයව පැවති බවට සාධක නොමැති නම් එම ගිණුම අත්හැර දැමූ දේපල ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ඇත.

## ස්ථාවර තැන්පත් ගිණුම් - කොන්දේසි හා නියමයන්

1. ගිණුම විවෘත කරන අවස්ථාවේ දී ලබා දී ඇති උපදෙස්වලට වඩා වෙනස් වන ආකාරයක ලිඛිත උපදෙස් තැන්පතු කාලය අවසන් වීමට අවම වශයෙන් දින 2කට පෙර ගනුදෙනුකරුවන් විසින් ලබා දී නොමැති නම්, බැංකුව විසින් කලින් කලට නියම කරන ලද කොන්දේසි වලට (පොලී අනුපාතික ඇතුලුව) යටත්ව බැංකුවේ අභිමතය පරිදි හා තැන්පත්කරුගේ උපදෙස් අනුව ඉදිරි කාලය පොලී සහිතව/රහිතව එකවර තැන්පතුව අලුත් කිරීමට බැංකුවට බලය ඇත.
2. ගිවිසගත් කාලයට ප්‍රථම තැන්පත්කරු/කරුවන් විසින් තැන්පතුව ආපසු ගැනීමේදී බැංකුව විසින් නිර්දේශිත අඩු පොලී අනුපාතිකයක් ගෙවීමටත්, සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහා ගිවිසගෙන ඇති මාසික පොලී ලබන තැන්පත්, තැන්පත් කාලය අවසන්වීමට ප්‍රථම ආපසු ගන්නා විට සම්පූර්ණ කාලසීමාව සඳහා එකඟ වූ ඉහළ පොලී අනුපාතය යටතේ වැඩිපුර ලබාගෙන ඇති පොලිය, මුල් මුදලින් හෝ එම අවස්ථාවේ ගෙවීමට ඉතිරිව ඇති පොලී ශේෂයකින් අයකර ගැනීමටත් බැංකුවට අයිතිය ඇත.
3. ස්ථිර තැන්පතු කුවිතාන්සිය අස්ථාන ගත වුවහොත් ඒ බව අප්‍රමාදව බැංකුවට ලිඛිතව දැනුම්දිය යුතුය.
4. **විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මෙහෙයවීම, පාලනය කිරීමේ විනිමය පාලන රෙගුලාසි සහ නියමයන් කෙරෙහි අනුකූලතාවයකින් යුතුව කටයුතු කිරීමට හා ඒවායින් බැඳී සිටීමට ගනුදෙනුකරු එකඟ විය යුතුය.**
5. ඔබගේ තැපැල් ලිපිනය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය වෙනස් වූ අවස්ථාවක ඒ බව නොපමාව අදාළ ශාඛාව වෙත දැනුම් දිය යුතුය.